පෝලියෝ රෝගයෙන් පෙළෙන තරුණියකට ලිංගික අතවර කළ බවට වූ චෝදනාව පදනම් කරගනිමින්, සැකකාර පොලිස් කොස්තාපල්වරයෙකු කොස්ගොඩ පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීමේ සිදුවීම, මාධ්‍ය කිහිපයක් ඔස්සේ වාර්තා වී තිබිණි.

එම පුවත වාර්තා කළ අරුණ, දිවයින සහ ලංකාදීප පුවත් වාර්තාවන් (මැයි 22, 23, 2023) එහිදී එම ලිංගික අතවරයට ලක්වූ බවට පැවසෙන තරුණිය සම්බන්ධයෙන් දක්වා තිබුණේ, පිළිවෙලින් "පෝලියෝ තරුණිය", "ආබාධිත කත" සහ "ආබාධිත දැරිය" යන යෙදුම් භාවිතා කරමිනි.

ආබාධ සහිත පුද්ගලයින්ව හැඳින්වීමේදී, ඔවුන්ව කොන් කිරීමකට හෝ ගර්හාත්මක ආකල්පයකින් නොසැලකීමට, ඔවුන්ව හඳුන්වන භාෂාව ද අදාළ වේ.

ඒ අනුව, ආබාධ සහිත පුද්ගලයින් හැඳින්වීමට පුද්ගල-ප්‍රථම භාෂාවක් (person-first language), නැතිනම් අනන්‍යතාවය-ප්‍රථම භාෂාවක් (identity first language) යොදාගැනීම යෝග්‍ය නොවන්නේ ද යන්න Ethics Eye අපි බොහෝ විට මාධ්‍ය වෙතින් මෙන්ම පාඨක ඔබෙන්ද අසමු.

ඒ අනුව,

1) "පෝලියෝ තරුණිය" වැනි යෙදුමකින්, පෝලියෝ රෝගයෙන් පෙළෙන තැනැත්තෙකු කොන් කිරීමක් ගම්‍ය වෙතැයි ඔබ නොසිතන්නේ ද?

2) මෙම පුවතේදී, "ආබාධිත කත" හෝ "ආබාධිත දැරිය" යන යෙදුම් වලට වඩා, "ආබාධයක් සහිත දැරිය", "පෝලියෝ රෝගයෙන් පෙළෙන තරුණිය" වැනි යෙදුම් වඩාත් උචිත නොවන්නේ ද? එයින් අදාළ අයව ආබාධය මූලික කොට ගනිමින් නොව, පුද්ගලයාව මූලික කොට ගනිමින් හැඳින්වීමක් සිදු නොවන්නේ ද?

මූලාශ්‍ර:

https://ncdj.org/style-guide/
https://pwd.org.au/.../2019/08/PWDA_LanguageGuide_A5_WEB.pdf
https://adata.org/factsheet/ADANN-writing

